(හයවැනි පාර්ලිමේන්තුව — සිව්වැනි සභාවාරය)

අංක. 35.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2009 ඔක්තෝබර් මස 21 වැනි බදාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0015/'09

1.

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මිහින් එයාර් ගුවන් සේවය සඳහා ආරම්භයේ සිට මේ දක්වා බදු පදනම මත ලබා ගෙන ඇති, මිලට ගෙන ඇති හෝ කුලියට ලබා ගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) මාසික පදනමින් ගෙවා ඇති හෝ ගෙවනු ලබන මුදල් ප්‍රමාණය කවරේද;

(iii) සමායන මට්ටම පවත්වා ගැනීම සඳහා ප්‍රවාහනය කළ යුතු මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

(iv) ගුවන් සේවාව ආරම්භ කරන අවස්ථාවේ සිට ප්‍රවාහනය කළ යුතුව තිබූ මගී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;

(v) සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව සහ අද වන විට ප්‍රවාහනය කර ඇති සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්ධන, ගුවන් තොටුපල හා ගුවන් සේවා කාර්යාල ඉඩකඩ සහ ගබඩා ඉඩකඩ, බදු වර්ග, ගුවන් යානා සඳහා ගෙවිය යුතු ගාස්තු, බැංකු ණය සහ අනෙකුත් විශේෂයෙන් සිදු කළ යුතු ගෙවීම්වලට අදාළව අද දින වන විට ගෙවීමට ඇති මුළු මුදල සහ එම එකිනෙක සඳහා කාලය අනුව ඉදිරිපත් කරන විශ්ලේෂණය කවරේද;

(ii) බඳවා ගත් සමස්ත කාර්ය මණ්ඩලය, ඔවුන්ට මාසිකව ගෙවිය යුතු ප්‍රේෂණවල මුළු වටිනාකම සහ රුපියල් 200,000/- ඉක්මවා වැටුප් ලබන සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් හට ලබා දෙන වෙනත් වරප්‍රසාද සඳහා මාසිකව වැය කරන මුළු මුදල කොපමණද;

(iii) සේවා ගිවිසුම් මගින් රක්ෂණ ආවරණයක් ලැබී තිබියදීත් ගුවන් යානා කාර්ය මණ්ඩල නඩත්තු රක්ෂණය (ACMI) වෙනුවෙන් ගෙවනු ලබන අමතර ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0084/09

2.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂයේ දී පමණක් රජය ණය ලබාගත් මූලාශ්‍ර හා පොලී අනුපාත කවරේද;

(ii) ලබාගත් ණය සඳහා ගිවිසුම්ගත කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2008 වසරේදී පමණක් රජය විසින් ආපසු ගෙවන ලද විදේශ ණය ප්‍රමාණය කොපමණද;

(ii) ආපසු ගෙවන ලද ණය පොලී ප්‍රමාණය කොපමණද;

(iii) ආපසු ගෙවන ලද විදේශ ණය හා පොලී ප්‍රමාණයන් කවර මූලාශ්‍ර මගින් ලබාගත් ණය වෙනුවෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

0095/'09

3.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) ස්වාධීන රූපවාහිනිය මගින් 2005, 2006, 2007 සහ 2008 වර්ෂවලදී පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරණය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදීමෙන් ඒ ඒ දේශපාලන පක්ෂවලින්, ආයතන හා පුද්ගලයින්ගෙන් එක් එක් වර්ෂයේදී ඉහත ආයතනය උපයාගෙන ඇති මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත පූර්ව මැතිවරණ කටයුතුවල යෙදීම හේතුවෙන් අයකර ගැනීමට ඇති මුදල කොපමණද;

(ii) ඒ කවර පක්ෂයකින්, කවර ආයතනයකින් සහ කවර පුද්ගලයෙකුගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0205/'09

4.

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) විදේශ ධීවර යාත්‍රා මගින් මාළු ගොඩබෑමේදී මාළු ශ්‍රේණිගත කිරීමක් සිදුකරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 සැප්තැම්බර් මාසයේදී, 2006 මැයි මාසයේදී සහ 2008 දෙසැම්බර් මාසයේදී විදේශ ධීවර යාත්‍රා මගින් මාළු ගොඩබෑමේදී, තුන්වැනි ශ්‍රේණියේ මාළු කිලෝග්‍රෑම් එකක් සඳහා ලංකා ධීවර සංස්ථාව අයකරනු ලැබූ මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0284/'09

5.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 2004 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2004, 2005, 2006 සහ 2007 වර්ෂවල සමෘද්ධිලාභීන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂ තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිටි එහෙත් පසුව ඉන් ඉවත් කරන ලද සංඛ්‍යාව සහ එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද්දේ කවර පදනමක් යටතේද;

(iii) අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටීනම් එම අයට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0290/'09

6.
ගරු විජිත රණවීර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005.09.09 හා අංක 1410 දරන ගැසට් නිවේදනය මගින් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍ර කැඳවන අවස්ථාවේදී, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු අධ්‍යාපන ආයතන සහ ගුරු මධ්‍යස්ථානවලට අනුයුක්තව සිටි කථිකාචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම්, ලිපිනයන්, වයස්, සේවා ස්ථාන, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2008.11.19 හා 2009.04.20 දිනයන්හි ස්ථිර කථිකාචාර්ය තනතුරට පත්වූවන් තෝරා ගනු ලැබුවේ 2007.03.19 දින සිට පැවති සම්මුඛ පරීක්ෂණයෙන්ද;

(ii) එම සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත්වූ අයගේ නම්, ලබාගත් ලකුණු හා සුදුසුකම් ලැබූ අයගේ නම් කවරේද;

(iii) ගුරු සේවයේ යෙදී නැති, ගුරු සේවයේ වසර 05ට අඩු හෝ උපාධි හෝ පශ්චාත් උපාධි නොමැති අය ස්ථිර සේවයට බඳවාගෙන තිබේද;

(iv) එසේ නම්, එහි නෛතික තත්වය කවරේද;

(v) ඔවුන්ගේ නම්, ලිපිනයන් සහ සුදුසුකම් කවරේද;

(vi) සුදුසුකම් සපුරා ඇති සහ දැනටමත් අනුයුක්ත සේවයේ නියුතු අය ස්ථිර සේවයට බඳවා ගෙන නොමැති නම් ඔවුන් ස්ථිර සේවයට බඳවා ගන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0365/'09

7.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2007 - 2008 වසරවලදී පොලිස් දෙපාර්තමේන්තුව විසින් අලුතින් ආරම්භ කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොලිස් ස්ථාන අතුරින්, උතුරු නැගෙනහිර ප්‍රදේශවල අලුතින් ඉදි කරන ලද පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පොලිස් ස්ථානවල ඉදි කිරීම් කරන ලද සමාගම් කවරේද;

(ii) අදාළ සමාගම් වෙත ඉදිකිරීම් භාර දීමට ටෙන්ඩර් කැඳවීමක් කළේද;

(iii) ටෙන්ඩර් අනුව ඉදිකිරීම් සිදුකර භාර දෙන ලද පොලිස් ස්ථාන හා ඉදිකිරීම් සිදුකළ සමාගම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එකී සමාගම් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් මේ වන විට කරන ලද ගෙවීම් ප්‍රමාණය කොපමණද;

(v) අලුතින් පොලිස් ස්ථාන ඉදිකිරීම් සඳහා නොගෙවා ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(vi) එකී ගෙවීම් කරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0452/'09

8\.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i)

| | | |
|---|---|---|
| පැල්මඩුල්ල | - | පී. ජී. හේමසිරි තිලකරත්න |
| නිට්ටඹුව | - | මොහොමඩ් මුසම්මිල් |
| යක්කල | - | රංජිත් ප්‍රේමරත්න |
| බත්තරමුල්ල | - | ලාල් පල්ලියගුරුගේ |
| අංගොඩ | - | අතුල පුෂ්පකුමාර |
| වැල්ලම්පිටිය | - | සිරිවර්ධන ගමරාලගේ |
| ගනේමුල්ල | - | නිහාල් බඩතුරගේ |

යන පිරිස ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ සේවා ගිවිසුම්ගතව රක්ෂණය වී, මරදාන ෆයිනාස් ඇසෝසියේටඩ් ආයතනය හරහා මාලදිවයිනේ සේවය සඳහා 2009 පෙබරවාරි මාසයේ දී පිටත්කර යවා ඇති බවත්;

(ii) අදාළ ගිවිසුම් ප්‍රකාරව එරටදී වැටුප් හා අනෙකුත් පහසුකම් නොලද බවත්;

(iii) මාලදිවයිනේ තානාපති කාර්යාලය වෙත ඔවුන් විසින් කරන ලද පැමිණිලි අනුව නැවතත් ඔවුන් මෙරටට ගෙන්වා ඇති බවත්;

(iv) මේ සම්බන්ධව ඔවුන් විසින් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වෙත පැමිණිලි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පැමිණිලි අනුව ඔවුන් වෙත වන්දි ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) ගිවිසුම් කඩ කරන ලද එම විදේශ රැකියා ආයතනය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0527/'09

9\.

ගරු චන්ද්‍රිම වීරක්කොඩි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2004 සිට 2009 දක්වා කාලසීමාව තුළ රාජකාරී වේලාවන්හිදී පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදී, රාජකාරිය පැහැර හැර ඇති බවට වාර්තාවී ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම වෛද්‍යවරුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එම වෛද්‍යවරුන් සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ගන්නා ලද විනය ක්‍රියාමාර්ග කවරේද;

(iii) එලෙස විනයානුකූල පියවර ගන්නා ලද වෛද්‍යවරුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0088/'09

10.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නගර සංවර්ධන සැලැස්මකට අනුව වැඩ අවසන් කළ නගරයක් හෝ නගර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර නගරද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නගර සංවර්ධන සැලැස්මේ කටයුතුවලට අනුව 50% කින් වැඩ අවසන් කළ නගරයක් හෝ නගර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර නගරද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0099/'09

11.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දිවයිනේ සියලුම පාසල්වල සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) උපාධිධාරී ගුරුවරුන් අතුරින් කලා, වාණිජ, විද්‍යා හා වෙනත් උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) උසස් පෙළ විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන හෝ ඉගැන්විය හැකි ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) එම උපාධිධාරීන් අතුරින් ඉංග්‍රීසි විෂයය උපාධිය සඳහා හදාරා ඇති හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය ලබාගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

(vi) මෙම උපාධිධාරීන් අතුරින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂයය සමත්වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට ප්‍රමාණවත් ගුරුවරුන් සංඛ්‍යාවක් නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0224/'09

12.

ගරු පේමසිරි මානගේ මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "පෙතඩීන්" එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) "පෙතඩීන්" එන්නත් රජයේ රෝහල්වලට ලබාදීම ආරම්භ කළේ කවදාද;

(iv) "පෙතඩීන්" එන්නත් භාවිත නොකර ඉතිරිව තිබෙන ප්‍රමාණය කොපමණද;

(v) "පෙතඩීන්" එන්නත් අපතේ යාමෙන් සිදුවූ මූල්‍යමය පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "මොපීන්" එන්නත් මෙරටට ගෙන්වීමට ඇණවුම් කළේ කවදාද;

(ii) ඒ කොපමණ ප්‍රමාණයක්ද;

(iii) "මොපීන්" එන්නත් රජයේ රෝහල්වලට බෙදාහැරීම ආරම්භ කළේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0389/'09

13.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා මැරයින් සමාගම, වෝටර්ස් එජ් සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රජය වෙත ආපසු පවරා දෙනු ලැබුවේ කෙදිනද;

(ii) ඒවා පුද්ගලිකරණය කළ දින සිට රජය වෙත ආපසු පවරා දෙනු ලැබූ දින දක්වා සහ මේ වන විට ඒවායේ ලාභය සහ අලාභය දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය සමග වාර්ෂික හා ආයතන පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලංකා මැරයින් සමාගම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ වෝටර්ස් එජ් මුලින්ම පවරාගනු ලැබූ ආයතනයන්ට ගෙවනු ලැබූ මුදල සහ ගෙවීමට නියමිත මුදල කොපමණද;

(ii) පුද්ගලික අංශයට බාරදෙනු ලැබූ අවස්ථාවෙහි සහ නැවත රජය වෙත පවරාදෙනු ලැබූ අවස්ථාවෙහි සේවයේ යෙදී සිටි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට සේවයේ යෙදී සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0105/'09

14.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) ජාතික රූපවාහිනිය 2005, 2006, 2007 සහ 2008 වර්ෂවලදී පූර්ව මැතිවරණ ප්‍රචාරක දැන්වීම් ප්‍රචාරණය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ආයතනය එම පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතු මගින් එක් එක් දේශපාලන පක්ෂයෙන් හෝ ආයතන හා පුද්ගලයින්ගෙන් වාර්ෂිකව උපයාගත් මුදල කොපමණද;

(ii) එසේ පූර්ව මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදීම හේතුවෙන් කොපමණ මුදලක් අය කරගැනීමට තිබේද;

(iii) එසේ අයකර ගතයුතුව ඇත්තේ කවර පක්ෂයකින්, කවර ආයතනයකින්, කවර පුද්ගලයෙකුගේ ප්‍රචාරක කටයුතු වෙනුවෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0489/'09

15.

ගරු පේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000 වර්ෂයේ සිට වන්දි හිමිකම් ලැබීමට නියමිත ආරක්ෂක හමුදාවේ පුද්ගලයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වන්දි හිමිකම් ලෙස ලබාදෙන මුදල කොපමණද;

(iii) මේ වන විට කොපමණ සංඛ්‍යාවකට වන්දි හිමිකම් ලබා දී තිබේද;

(iv) අදාළ වන්දි හිමිකම් ලබාදීම කල් ගතවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමා,— ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන),— 1982 අංක 28 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

ගරු ලලිත් දිසානායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" අනුරාධපුර ශ්‍රී පුෂ්පදාන සංවර්ධන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

3.

ගරු ලලිත් දිසානායක මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය,—

" බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 123— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් හත්සිය පහළොවකට (රු. 1,715,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 123 | — | නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් | |
| | ප්‍රාග්ධන වියදම් | | රු. | 1,715,000,000 |
| | | | රු. | 1,715,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 සැප්තැම්බර් මස 24 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 14 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 13 දක්වා එකතුව රු. 20,780,903,938.

*2.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 105— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හත්සිය අසූහත් කෝටි හැත්තෑ පන් ලක්ෂයකට (රු. 7,877,500,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 105 | — | ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය | |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් | |
| ව්‍යාපෘතිය | 10 | — | විදේශාධාර සංවර්ධන ව්‍යාපෘති | |
| ප්‍රාග්ධන වියදම් | | | රු. | 7,877,500,000 |
| | | | රු. | 7,877,500,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 15 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 14 දක්වා එකතුව රු. 22,495,903,938.

*3.

ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 166— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දෙදහස් එකසිය හතලිස් පහකට (රු. 2,145,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 166 | — | ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන ක්‍රියාකාරකම් |
| ව්‍යාපෘතිය | 05 | — | මහා පරිමාණ ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය |
| උප ව්‍යාපෘතිය | 15 | — | ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය |

මූල්‍යකරණ අංක 12
(විදේශාධාර ණය)

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | රු. | 1,295,000,000 |

මූල්‍යකරණ අංක 17
(විදේශාධාර සබැඳි දේශීය අරමුදල්)

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | රු. | 850,000,000 |
| එකතුව | රු. | 2,145,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 22 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 21 දක්වා එකතුව රු. 64,220,003,938.

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 117— වැඩසටහන 02,—† 2009 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2009 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන දස දහස් හයසිය හතලිස් එකකට (රු. 10,641,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතු ය.

උපලේඛනය

| | | | | | |
|---|---|---|---|---|---|
| ශීර්ෂය | 117 | — | මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය | | |
| වැඩ සටහන | 02 | — | සංවර්ධන කාර්යයන් | | |
| ව්‍යාපෘතිය | 03 | — | අධිවේගී මාර්ග සංවර්ධනය - (දේශීය අරමුදල්) | රු. | 408,000,000 |
| | 04 | — | මහාමාර්ග සංවර්ධනය- (දේශීය හා විදේශීය අරමුදල්) | රු. | 819,000,000 |

| | | | |
|---|---|---|---|
| 05 | — | මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම-(දේශීය හා විදේශීය අරමුදල්) | රු. 1,610,000,000 |
| 06 | — | පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීම - (දේශීය හා විදේශීය අරමුදල්) | රු. 5,584,000,000 |
| 07 | — | සුනාමියෙන් විපතට පත් මාර්ග පුනරුත්ථාපනය කිරීම - (දේශීය හා විදේශීය අරමුදල්) | රු. 2,005,000,000 |
| 08 | — | ආයතනික සහාය - (දේශීය අරමුදල්) | රු. 215,000,000 |
| | | එකතුව | රු.10,641,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2009 ඔක්තෝබර් මස 09 වැනි දින ඉදිරිපත් කරන ලද 2009 අංක 23 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 22 දක්වා එකතුව රු. 66,365,003,938.

*5.

කැළෑ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*6.

පතල් හා ඛණිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*7.

ඉන්දියානු ආගාමික කම්කරු (ඉවත්කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

වත්කම්වලින් ආවරණය වූ සුරැකුම්කරණය විධිමත් කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ගෙවීම් පැහැර හරිනු ලැබූ බදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*12.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*13.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*14.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*15.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*16.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*17.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*18.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) [1]

*19.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04) [1]

*20.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

මැතිවරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අංක 6/2006 දරන 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානයන්ට යටත්ව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා මාසික වැටුප් පහත සඳහන් පරිදි විය යුතු යැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 70,000/- |
| | රු. 1,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 65,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 63,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු වැටුප් ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගන්නා ලද වැටුප් පරිමාණයන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*25.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමා, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්, අභියාචනාධිකරණයේ සභාපතිතුමා සහ අභියාචානාධිකරණයේ විනිශ්චයකාරවරුන් සඳහා, වැටුපෙන් 25%කට සමාන මාසික පෞද්ගලික දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, ශ්‍රේෂ්ඨාධිකරණ හා අභියාචනාධිකරණ විනිසුරුවරුන්ට ගෙවිය යුතු පෞද්ගලික දීමනාවක් ලෙස පාර්ලිමේන්තුව විසින් 1998 මාර්තු මස 17 වැනි දින සම්මත කරනු ලැබූ දීමනාවන් වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පෞද්ගලික දීමනාවන් ක්‍රියාත්මක විය යුතු බව මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*26.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— 2007.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට සහ අභියාචනාධිකරණයේ සභාපතිතුමාට හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට පහත සඳහන් පරිදි මාසික ගෙවල් කුලී දීමනා ගෙවිය යුතු බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

| | |
|---|---|
| ගරු අග්‍රවිනිශ්චයකාරතුමා | රු. 27,500/- |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් හා අභියාචනාධිකරණයේ සභාපති | රු. 25,000/- |
| අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් | රු. 22,500/- |

තවද, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්ට ගෙවිය යුතු ගෙවල් කුලී දීමනාව ලෙස 2004 සැප්තැම්බර් මස 09 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබූ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන ගෙවල් කුලී දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*27.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 4),— 2008.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අග්‍රවිනිශ්චයකාරතුමාට, සංග්‍රහ දීමනාව ලෙස මාසිකව රු. 3,500/- ක දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 108(1) ව්‍යවස්ථාව යටතේ මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරනු ලබයි.

තවද, මෙයට පෙර අගවිනිසුරුවරයා සඳහා පාර්ලිමේන්තුව නිශ්චය කර ඇති සංග්‍රහ දීමනාව වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන සංග්‍රහ දීමනාව ක්‍රියාත්මක විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව මෙයින් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*28.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ වූ නියෝග,— 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 26 වගන්තිය සමග කියවිය යුතු 212 වගන්තිය යටතේ යම් පුද්ගලයෙකු යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද සම්බන්ධයෙන් වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූනි මස 19 දිනැති අංක 1606/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*29.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ වූ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූනි මස 30 වැනි දිනැති අංක 1608/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*30.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ වූ නියෝග,— 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සිගරැට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලදුව, 2009 ජූලි මස 17 වැනි දිනැති අංක 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.10. 08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*31.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විමසා සාදන ලදුව, 2009 සැප්තැම්බර් මස 03 වැනි දිනැති අංක 1617/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ 2009.10.08 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*32.

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— පාංශු සංරක්ෂණ පනත යටතේ නියෝග,— (450 වැනි අධිකාරය වූ) 1951 අංක 25 දරන පාංශු සංරක්ෂණ පනතේ 4 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, පාංශු සංරක්ෂණ පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා වන 2009.10.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*33.

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා,— සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යටතේ නියෝගය,— 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනා පනතේ 11 වැනි වගන්තිය යටතේ කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යතුමා විසින් සාදනු ලැබ, 2009 මැයි මස 19 දින, අංක 1602/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.08.26 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*34.

ප්‍රවාහන අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝගය,— 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 46 (ඌ) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 44 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යතුමා විසින් පනවන ලදුව 2009 මැයි මස 29 දිනැති අංක 1603/44 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.09.10 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*35.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥාපනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*36.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥාපනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*37.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— වෛද්‍ය ආඥාපනත යටතේ නියෝග,— (105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥාපනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2009 පෙබරවාරි මස 25 දිනැති අංක 1590/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.04.21 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*38.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*39.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*40.

සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද

විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදි.)

*41.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*42.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ අතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*43.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

44.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

45.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

46.

පිළියන්දල ධර්මශාස්ත්‍රෝදය පිරිවෙන් විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

47.

මාතර රාහුල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (කොළඹ ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

48.

බලහත්කාරයෙන් ආගම්වලට හරවා ගැනීම තහනම් කිරීමේ පනත් කෙටුම්පත — සලකා බැලීම.

49.

සම්භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.

---

[1]

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

0022/'09

1

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) මේ දක්වා වූ පසුගිය වසර 4ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය විසින් සහ එම අමාත්‍යාංශයට අයත් ඕනෑම සමාගමක් සඳහා කුලියට ගත් එක් එක් වාහනය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල හා කුලියට ලබා ගත් කාර්යාලයීය ඉඩකඩ සඳහා ගෙවන ලද මුළු මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත කාල සීමාව තුළ —

(i) ඉහත කී වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් වැය කළ මුදල කොපමණද හා එම මුදල අමාත්‍යාංශයේ සමස්ත පුනරාවර්තන වියදම් වලින් කුමන ප්‍රතිශතයක්ද;

(ii) ඉහත සඳහන් කාර්යාලයීය ඉඩකඩ සඳහා එක් වර්ග අඩියක් වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කල්බදු ක්‍රමය යටතේ එම ගොඩනැගිල්ල ලබා ගෙන ඇත්තේ කොපමණ කාලයක් සඳහාද හා තැන්පතුවක් ලෙස අත්තිකාරම් වශයෙන් ගෙවන ලද මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0440/'09

2.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මධ්‍යම පළාත් සභා මැතිවරණ රාජකාරි සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරීන්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන සහ තනතුරු මාතලේ, මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කයනට අදාළව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) වයඹ පළාත් සභා මැතිවරණ රාජකාරි සඳහා යෙදවූ ඡන්ද මධ්‍යස්ථාන භාර නිලධාරින්ගේ නාම ලේඛනය, එම නිලධාරීන් සේවය කරන ආයතන, තනතුරු හා දිස්ත්‍රික්ක ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මධ්‍යම හා වයඹ මැතිවරණ දිනයන්හි ක්‍රියාත්මක වූ පරිගණක කාර්යාලයේ

නිලධාරින්ගේ නම්, තනතුරු සහ ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?